ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන 2022/2023

4 වන මට්ටම - අවසාන පරීක්ෂණය 183

**EPU4232 - නිවස, පාසල සහ ප්‍රජාව අතර, සම්බන්ධතාව.**

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2024.03.03 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.

## 1 - වන කොටස

01. පවුල, පාසල සහ ප්‍රජාව අතර, ඇති සම්බන්ධතාව යන යෙදුමෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

02. "ප්‍රාථමික මට්ටමේ අරමුණු ලඟාකර ගැනීම සඳහා සියලු ප්‍රාථමික ගුරුවරුන් දෙමව්පියන් සමඟ හොඳ සම්බන්ධතාවක් පවත්වා ගෙන යා යුතුය."

    ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? කරුණු තුනක් (03) දක්වමින් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

03. පවුල සහ පාසල අතර, සම්බන්ධතාවයට අදාළ ප්‍රධාන මාන පහක් (05) සඳහන් කර, එයින් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

04. "හැසිරීම් සංවර්ධනය" යන යෙදුම සුදුසු නිර්වචනයක් යොදා ගනිමින් නිර්වචනය කරන්න.

05. ප්‍රාථමික පාසල් ගුරුවරයෙකු ලෙස ඔබ සහභාගී වූ පාසල් මට්ටමේ ප්‍රජා ව්‍යාපෘති පහක් (05) ලැයිස්තු ගත කරන්න.

06. ප්‍රාථමික පාසලක ප්‍රජා සහභාගිත්වය සහිත ක්‍රියාකාරකමක් කෙටියෙන් විස්තර කරන්න.

07. ආදර්ශකයක් ලෙස ප්‍රාථමික පාසල් ගුරුවරයෙකුගේ භූමිකාව කෙටියෙන් සාකච්ඡා කරන්න.

08. ප්‍රාථමික පාසල් ගුරුවරයෙකු ලෙස ප්‍රජාව තුළින් ඔබ ලබාගත් ප්‍රතිලාභ පහක් (05) ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 5 X 8 = 40)

## 02 - කොටස

09. (i.) ප්‍රාථමික පාසලක දෙමව්පිය සහභාගිත්වය තුළින් ගුරුවරයා ලබා ගන්නා ප්‍රතිලාභ තුනක් **(03)** උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු - 10)

(ii.) ප්‍රාථමික පාසලක ක්‍රියාකාරකම් වලට දෙමව්පියන් සම්බන්ධවීමේදී ප්‍රාථමික පාසල් ගුරුවරයෙකු ලෙස ඔබ මුහුණදුන් ගැටලු සාකච්ඡා කරන්න. (ලකුණු - 10)

10. (i.) "දරුවන්ගේ පුද්ගල විවිධතා සැලකිල්ලට ගෙන ගුරුවරයා ක්‍රියාකාරකම් සංවිධානය කළ යුතුය."

ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු **පහක් (05)** සපයන්න. (ලකුණු - 10)

(ii.) පවුල සහ පාසල අතර, සාර්ථක සහයෝගී සම්බන්ධතාවක් ගොඩනැගීමට අදාළ වන **විශ්වාස සහ ආකල්ප** විස්තර කරන්න. (ලකුණු - 10)

11. (i.) දෙමව්පියන් සහ පාසල අතර, ඵලදායි සහ නිර්මානාත්මක සන්නිවේදනයක් ගොඩනැගීමට අදාළ වන ක්‍රම **හතරක් (04)** සාකච්ඡා කරන්න. (ලකුණු - 08)

(ii.) ප්‍රාථමික පාසල් ගුරුවරියක ලෙස ඔබගේ පාසල හා පවුල අතර ධනාත්මක සම්බන්ධතාවක් සංවර්ධනය කර ගන්නේ කෙසේදැයි උදාහරණ **පහක් (05)** මඟින් පැහැදිලි කරන්න. (ලකුණු - 12)

12. (i.) "ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ ප්‍රජා මැදිහත්වීම වැඩි දියුණු කිරීම සඳහා උපායමාර්ග රාශියක් පවතී"

ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? කරුණු පහක් දක්වමින් විවේචනාත්මකව ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු - 10)

(ii.) ප්‍රජාව සහ පාසල අතර, ඵලදායි සම්බන්ධතාවක් ගොඩනැගීමේ දී රජයේ වගකීම් විස්තර කරන්න. (ලකුණු - 10)

13. පහත සඳහන් ඕනෑම **දෙකක් (02)** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i.) ප්‍රාථමික පාසලක පාරිසරික ව්‍යාපෘති

(ii.) ප්‍රාථමික පාසලක දෙමව්පිය මැදිහත්වීමේ බලපෑම

(iii.) ප්‍රජාව තුළ දක්නට ලැබෙන සමාජ සහ සංස්කෘතික සුවිශේෂිතා

(iv.) කුඩා දරුවන්ගේ කායික සංවර්ධනය (ලකුණු 10 x 2 = 20)

- හිමිකම් ඇවිරිණි. -